දිවි තොර කරගැනීමක් හෝ දිවි තොර කරගැනීමකට අදාළ වන හෝ පුවතක් පළ කිරීමේදී මාධ්‍ය අතිශයින්ම ප්‍රවේසම් සහගත විය යුත්තේත්, ආචාර ධාර්මික ප්‍රවේශයක් ගත යුතු වන්නේත්, එසේ නොවන පුවත් වාර්තාවන් ඔස්සේ වුවද අනුකාරක දිවි තොර කරගැනීම් සඳහා අනුබල ලැබීමේ හැකියාවක් ඇති බැවිනි.

උදාහරණයක් ලෙස, පහත දැක්වෙන මව්බිම පුවත් වාර්තාව ගත හැක. එහි,

1) දිවි තොර කරගැනීමට තැත් කළ ආකාරය සඳහන් කර ඇති අතර, එය දීර්ඝ ලෙස විස්තර කොට ඇත. දිවි තොර කරගැනීමට තැත් කළ ආකාරය පුවතට අදාළ යැයි සැලකුවද, එය දීර්ඝ ලෙස විස්තර කිරීම ඔස්සේ අනුකරණාත්මක දිවි තොර කරගැනීම් සඳහා උත්තේජනයක් සැපයිය හැක.

2) දිවි තොර කරගැනීමට තැත් කළ හේතුව සරලව දක්වා ඇත. දිවි තොර කරගැනීමකට තැත් කිරීමක් සඳහා සංකීර්ණ හේතු තිබේ. එහෙයින් එවැනි ප්‍රයත්නයකට හේතුව අතිසරල කොට දැක්වීම ඔස්සේ, එවැනි සිදුවීමකට මුහුණ දෙන, දිවි තොර කරගැනීමේ නැඹුරුතාවක් ඇති අය දිවි තොර කරගැනීමට පෙළඹීමේ අවදානමක් තිබේ.

3) උපකාරක අංක සඳහන් කර නොමැත. දිවි තොර කරගැනීම් හෝ ඊට තැත් කිරීම් පිළිබඳ පුවත් වාර්තාවන් හා හදිසි උපකාරක අංක සඳහන් කරන මෙන් පැවසෙන්නේ, ඒ ඔස්සේ තවත් දිවි තොර කරගැනීම් වැළැක්වීමට හැකියාවක් ඇති කරනා බැවිනි.

එසේ ගත් විට, මෙම පුවත් වාර්තාව පිළිබඳ ඔබේ අදහස් මොනවාද?

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

මූලාශ්‍ර:
https://media.samaritans.org/.../Media_Guidelines_FINAL.pdf
https://apps.who.int/iris/bitstream/handle/10665/258814/WHO-MSD-MER-17.5-eng.pdf;jsessionid=D14833A4878E3B3D96D0721858FB5F4E?sequence=